සැ.යු - මෙම අති විශේෂ ගැසට් පත්‍රයෙහි 2A පිටුවෙහි "නඩු අංකය A/02/2025 " හා " IR/COM/04/2023/160 " ලෙස පළවූ කොටස් "නඩු අංකය A/86/2019 " හා " IR/COM/02/2018/252 " ලෙස නිවැරදි විය යුතු ආකාරයට නැවත සකසන ලදී.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2451/22 – 2025 අගෝස්තු මස 27 වැනි බදාදා – 2025.08.27**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2018/252.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.08.26 දිනැති හා අංක 2138/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.08.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මුල්ලේරියාව, මුල්ලේරියාව නව නගරය, හිඹුටු උයන නිවාස ක්‍රමය, බී 05/01/04 හි පදිංචි බී.ඒ.එස්.සී. අබේවර්ධන මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, තැ.පෙ. 1826 හි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/86/2019 හා 2025.07.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අගෝස්තු මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව

නඩු අංකය : A/86/2019
IR/COM/02/2018/252

බී.ඒ.එස්.සී. අබේවර්ධන මයා,
බී 05/01/04,
හිඹුටු උයන නිවාස ක්‍රමය,
මුල්ලේරියාව නව නගරය,
මුල්ලේරියාව.

*පළමු පාර්ශ්වය*

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
තැ.පැ. 1826,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියේ ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා හට පවරා ඇත.

එකී යොමු කිරීම අනුව පාර්ශ්වකරුවන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී ඇත්තේ "ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයකු වන බී. ඒ. එස්. සී. අබේවර්ධන මහතා 2015.09.11 වන දින සිට වැඩ තහනම් කර පවත්වන ලද විනය පරීක්ෂණයකින් අනතුරුව සියලු චෝදනාවලින් නිදොස් කර පසු වැටුප හා ඔහුට හිමි වරප්‍රසාද සමඟ නැවත සේවයේ පිහිටුවීමට තීරණය කළ ද අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නැවතත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කිරීම හේතුවෙන් බී.ඒ.එස්.සී. අබේවර්ධන මහතාට අසාධාරණයක් සිදුවී තිබේ ද යන්න හා එසේ සිදු වී තිබේ නම් ඔහුට හිමි සහනයන් කවරේද" යන්න පිළිබඳව වේ.

දෙපාර්ශ්වය විසින් අදාළ විස්තර ප්‍රකාශ ගොනු කළ පසු 2022.03.09 වන දින ඉල්ලුම්කරු වෙනුවෙන් නීතිඥ බී. ඒ. ඩබ්ලිව්. අබේවර්ධන මහතා ද, වග උත්තරකාර ආයතනය වෙනුවෙන් නීති නිලධාරිණී ඩබ්.කේ. පෙරේරා මහත්මිය සමඟ නීතිඥ එම්.ආර්.එෆ්. ෂබ්නා රහීක් මහත්මිය පෙනී සිටිමින් විභාගය ආරම්භ කරන ලදි. එදින පෙ. 1 සිට පෙ. 23 දක්වා ලේඛන ලකුණු කරන ලදි. ඒ සාක්ෂි මත 2022.03.25 වන දින වග උත්තරකාර ආයතනය හරස් ප්‍රශ්න අසන ලදි. සේවා චක්‍ර ලේඛනයේ තමා උසස්වීම් ඉල්ලා නොසිටින බැවින් කළමනාකරණ සේවා චක්‍රලේඛන 30 යටතේ M M ශ්‍රේණියට 2012.03.19 දින සිට පත් කරන ලෙසත් තමා සිටි ශ්‍රේණියේ අන් අයට දෙන ලද M M 1-1-2 ශ්‍රේණිය ලැබිය යුතු බවත් එයට අවශ්‍ය සුදුසුකම් තමාට තිබූ බවත් කළමනාකරණ චක්‍රලේඛන 30 ක්‍රියාත්මක කරන ලද්දේ 2012.03.19 දිනට පසු දාතම් කරමින් අන්තර්ග්‍රහනය කළේ 2016 බවත් ය.

නැවත ප්‍රශ්න විමසීමේ දී 2015.09.11 දින සිට 2020.01.07 දක්වා වැඩ තහනම් කළ කාලය තුළ සේවය කළා නම් එම කාලය තුළ සේවක භාරකාර අරමුදල් හා සේවක අර්ථ සාධක අරමුදල් ගෙවනු ලබන පොලී ප්‍රතිශතය අහිමි වී ඇති බව ඉල්ලුම්කරු කියා සිටින ලදී. තවද ඔහුගේ සේවා කාලය අසතුටුදායක නැති බවත් (අසාධාරණ විනය පරීක්ෂණය ඇරුණ විට සේවා කාලය තුළ හැම වැටුප් වර්ධකයක් ම ලබා ඇති බවත්) ඔහු හා සමානව සිටි අයට යම් තනතුරකට උසස්වීම් දී තිබේ නම් එය ඔහුට ද හිමි විය යුතු බවයි. තමා හා සමාන තත්වයේ සිටි අයට හා ඔහුට පහළ ශ්‍රේණිවල අයට උසස්වීම් දීමේ දී ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා සාධාරණ ක්‍රමයක් යටතේ උසස්වීම් ලබාදීමක් සිදු වී නැති බවත්ය. 2016. වසරේ විධිමත් ඉල්ලුම්පත් කැඳවන උසස්වීම් දීමේ දී හා 2020 වර්ෂයේ දී උසස් තනතුරුවලට ඉල්ලීම් කිරීමේ දී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ඉංජිනේරු හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මුදල් තනතුරු හැර අනිකුත් තනතුරුවලට ඉල්ලුම් කිරීමට හැකියාව තිබුණත් ඉල්ලුම්කරු සේවයේ පිහිටුවීමේ දී MM 1.1.2 කාණ්ඩයේ පිහිටුවිය යුතු වුවත් එය සිදු නොවීම නිසා අයදුම්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවයි.

2022.08.09 දින සිට වග උත්තරකාර පාර්ශ්වය බී.එස්.ටී. නන්දසිරි පාලන නිලධාරි හා විනය කළමනාකරු කැඳවන ලදී. අවුරුදු 22 ක සේවා කාලයකින් යුතු වන අතර, විනය කළමනාකරු ලෙස අවුරුදු 3 ක පමණ කාලයක සිට සේවය කරන බව කියා සිටී. ඉල්ලුම්කරු 2011 ජනවාරි 05 දින සිට උසාවි කටයුතු කළමනාකරු ලෙස පත්කර ඇත. 2015.09.11 වන දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි වැඩ තහනම් කර ඇත. ආර් 9 ලේඛනයට අනුව විමර්ශනයක් කර ඇත. 2017.06.20 දින නිකුත් කළ විමර්ශන වාර්තාව අනුව සියලු චෝදනා වලට ඉල්ලුම්කරු නිවැරදිකරු වී ඇත. ඒ අනුව 2017 නොවැම්බර් මස පරිපාලනය නිර්දේශ කරමින් අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ බවත් (R10) එම වාර්තාවට අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමකට පත්නොවී නැවත විනය පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් (R 11) දුන් බවයි.

2020 ජනවාරි 01 දින සිට නැවත සේවයේ පිහිටුවා ඇති බවත් (R 13) ය. ඒ අනුව 2020 ජනවාරි 07 දින සිට සේවයට වාර්තා කර ඇත. (R 13 A) ඉන්පසුව තනතුරු නාමය (R18 ) ප්‍රතිව්‍යුහගත කර ඇත. (R 18A) මගින් කළමනාකරණ චක්‍රලේඛන 2/2016 අනුව වැටුප් පරිවර්තනය කළ බවත් 2020 ජුලි 10 J M 1-1 වැටුප් කාණ්ඩයේ 01 ශ්‍රේණියේ පරිපාලන නිලධාරි තනතුරට උසස් කරනු ලැබූ බව (R 19) කියා සිටී. 2012.03.19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 10/425 දරන අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව මත දී තිබූ අනුමැතිය මත 2023.01.31 දින සිට M M 1-1-2 කියන කාණ්ඩයට ඇතුලත් කළා. තව දුරටත් ඉල්ලුම්කරු කියන ආකාරයට 2020.10.28 දින සිට HM කාණ්ඩයේ තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොතිබූ දේශපාලන පලිගැනීම්වලට ලක්වූ 4 දෙනෙකුට උසස් වීම් අධ්‍යක්ෂක මණ්ඩල තීරණ මත සිදුකළ බවයි. අධ්‍යක්ෂක මණ්ඩල තීරණ මත දෙන ලද උසස් වීම් “බඳවා ගැනීම් පටිපාටිය සලකා බලා නෙවෙයි. පත්වීම් බලධාරීයාගේ තීරණය මතයි” යනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේ දී පිළිතුරු දුන් අතර කළමනාකරණ චක්‍රලේඛනය මත නොවන බවත් සාක්ෂි දී ඇත.

එමෙන්ම විනය පරීක්ෂණය අවසානයේ දෙපාර්ශ්වයේ එකඟතාවය මත ක්‍රමානුකූලව විධිමත්ව පවත්වා ගෙන ගිය බව පරීක්ෂක නිලධාරි තම වාර්තාවේ සටහන් තබා ඇති බව පිළිගන්නා ලදී. එය ආයතන සංග්‍රහයට අනුව කර ඇති බව ද පිළිගන්නා ලදී. 2017.06.20 දින දෙන ලද තීන්දුව ඉල්ලුම්කරුට දෙන ලද්දේ 2018.01.16 නිලධාරියාගේ සටහන අනුව දෙවන විනය පරීක්ෂණයකට නොයා වහාම සේවයේ පිහිටු වන ලෙස නිරීක්ෂණ සටහනක් තබා ඇති බව පිළිගනි.

R 11 ට අනුව බලධාරින්ගේ කරුණු දැක්වීම හා උපදෙස් දීම ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන වලට ද අනුකූල නැත.

වග උත්තරකාර ආයතනයේ සාක්ෂිකාරිය වන ඩබ්.ඒ. ශ්‍රියාපාලි වික්‍රමසිංහ සාක්ෂි දෙමින් වැටුප් අංශයේ හිඟ වැටුප් සකස් කරන ලද්දේ ඇය බවත් 2015 සිට 2020.01.16 දක්වා නොගෙවූ වැටුප් ගණනය කර දීමනා ද සහිතව ගෙවීම් කළ බව කියා සිටී. EPF/ETF ගණනය කර යවලා තිබෙන බවත් එයට යම් පොලී මුදලක් ලැබෙන බවත් යම් කාල සීමාවක් තුළ ගෙවීම් නොකර සිටින විට පොලී මුදල් එකතු නොවන බවත් පිළිගනි. R 18 aට අනුව 40 සංවත්සර දීමනාව ගෙවා නැත. R 25 aට ලේඛනයේ සඳහන් 2017.03.01 දිනට අදාළ විශේෂ වැටුප් ගෙවීම් ගලපා හදලා නැති බව පිළිගනි.

එයට හේතු වී ඇත්තේ උසස් වීම් දෙන ලද අයට එකී දීමනාව නොගෙවන බවයි. එහෙත් උසස් වීමක් නොව රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛනයේ 30 ට අනුව අන්තර් ග්‍රහණය කිරීමේ දී වැටුප් සකස් කිරීමක් නිසා නැවත එම විශේෂ දීමනා ලබාදීම පිළිබඳව සොයා බලා එම දීමනාව ලබා දිය යුතුව ඇත.

මෙම නඩුවේ දෙපාර්ශ්වයේ සාක්ෂි හා ලේඛන පරීක්ෂා කිරීමෙන් හා විශ්ලේෂණය කිරීමෙන් පෙනී යන්නේ ඉල්ලුම්කරුට අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති කර (කළුතර ප්‍රාදේශීය කාර්යාලට වාහන ලබා ගැනීම සම්බන්ධව කරන ලද පරීක්ෂණයෙන් චෝදනා හතරෙන්ම නිදහස් කර ඇතත් (පෙ.3) අධ්‍යක්ෂක මණ්ඩලය, සභාපති ද ඇතුලුව ගන්නා ලද වැරදි තීරණ හා නිගමන මත පළමු පරීක්ෂණය අවලංගු කර දෙවනවරට ද විනය පරීක්ෂණයක් පැවැත්වීමට සූදානම් වීම තුළින් ඉල්ලුම්කාර බී.ඒ.එස්.සී. අබේවර්ධන මහතාට තදබල අසාධාරණයක් සිදුවී ඇති බව කිව යුතුය. විනය නිලධාරියා විනය පරීක්ෂණ වාර්තාවට එකඟ නොවේ නම් ආයතන සංග්‍රහයේ ii කාණ්ඩයේ xlv iii පරිච්ඡේදයේ 22.4. සිට 22.8 පිටුව දක්වා සහ 22.9 අනුව විනය බලධාරියා විසින් අදාළ විනය ගොනුවේ පැහැදිලිව හා නිශ්චිතව සටහනක් තබා නැවත පරීක්ෂණයට යා යුතුය. (පෙ.5. පෙ. 9. සහ පෙ. 10 ) එසේ පැහැදිලිව සඳහන් ව ඇතත් ඒ බවට පෙ. 4 මගින් නීතිඥයකු වන නිවාස සංවර්ධන අධිකාරියේ මානව සම්පත් හා කළමනාකරණ හා පාලන කරුණු පෙන්වා දී ඇතත් එය නොතකා අධ්‍යක්ෂක මණ්ඩලය දෙවන පරීක්ෂණයකට යාමට තීරණය කිරීම නිසා ඉල්ලුම්කරුට අධ්‍යාපන සුදුසුකම් ඇතත් සේවා පලපුරුද්ද ලබා ගැනීමේ අවස්ථාව අහිමි වීම නිසා උසස් වීම් අහිමි වී ඇත. කිසිම වැටුපක් (අඩ වැටුප්) නොලබා වර්ෂ ගණනක් ජීවිතය ගෙන යාමට සිදුවීම පිළිබඳව එවකට අධ්‍යක්ෂක මණ්ඩලය වගකිව යුතුව ඇත. එය විනය බලධාරියා වන අධ්‍යක්ෂක මණ්ඩලය කළමනාකරණ චක්‍රලේඛනය අතික්‍රමණය කිරීමට උත්සහ කර තිබීමකි.

ඉල්ලුම්කරු අසාධාරණ වැඩ තහනමකට ලක් කිරීම නිසා වැටුප් නොගෙවා සිටි කාලයට අදාළ සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් පසුව ගෙවා ඇතත් ඊට අදාළ පොලිය අහිමි වී ඇත. එසේම සේවක භාරකාර අරමුදලේ පොලියද අහිමි වී ඇත. කළමනාකරණ සේවා චක්‍රලේඛන 30 විධිවිධාන පරිදි පිහිටු විය යුතුව තිබූ ශ්‍රේණියේ පසුදාතම් කර නොපිහිටු වීම නිසාත් තනතුර උසස් වීම සඳහා ඉල්ලුම් කිරීමට තිබූ අවස්ථාව අහිමිකර ඇත. 2020.10.18 දින අයදුම් පත් කැඳවන අවස්ථාවේ අධ්‍යාපන සුදුසුකම් තිබුණත් ඉල්ලුම්පත්

ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. සේවා පළපුරුද්ද වැඩතහනම් කළ කාලය තුළ ලබා ගැනීමට නොහැකි වීම නිසා 2012.03.19 දින සිට පසුදාතම් කර කළමනාකරණ චක්‍රලේඛන 30 ට අනුව නැවත තනතුරු හා එම තනතුරට අදාළ වැටුප සකස් කළ යුතුය. (නිසි ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු වී නැත) ඉල්ලුම්පත් නොකැඳවා හෝ දේශපාලන නිර්දේශ පිට හෝ තනතුරු උසස් කර තිබීම සමාන තනතුරු වල සිටින්නන්ට උසස්වීම් ලබා දීම නිසා ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදු වූ බව පෙනී යන අතර එකී උසස්වීම් දීම විනිවිද භාවයෙන් කරන ලද බව දෙවන පාර්ශ්වය ඔප්පු කළේ හෝ එයට විරෝධතා නොදක්වන ලදී. නියමිත ආකාරයට තනතුරේ නොපිහිටු වීම නිසා අධ්‍යාපන සුදුසුකම් ඇතත් උසස් තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය සේවා පලපුරුද්ද ලබා ගැනීමට නොහැකි වීමත් විනය පරීක්ෂණ වාර්තාව ප්‍රමාද කර දැනුම් දීම නිසාත් ඉල්ලුම්කරුට පහල නිලයක සිටි අයට සහ සම තත්වයේ සිටි තැනැත්තන්ට දෙන ලද උසස් වීම් සලකා බලා ඔවුන්ට උසස්වීම් දෙන ලද දින සිට කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 ට අනුව H.M. 1.1 ශ්‍රේණිය පසු දාතම් කර අධි සේවක පදනම මත ලබා දෙන ලෙසත් ඒ අනුව කළමනාකරණ සේවා චක්‍රලේඛන 02/2016 අනුව වැටුප් පරිවර්තනය කරන ලෙසට හා 2017.01.01 හිමි වැටුප් වර්ධක එයට අනුව ගෙවන EPF, ETF සකස් කර හිඟ වැටුප් හා නොගෙවූ දීමනා ලබා දෙන ලෙසත් නියෝග කරමි.

වැටුප්, දීමනා, හා ETF, EPF ගණනය කිරීම් පිළිබඳව අධිකරණයට කළ නොහැකි බවත් දැනටමත් ඉල්ලුම්කරු අනාගත සේවා කාලයට ද ගණනය කිරීම් කර ඉදිරිපත් කර තිබීම පිළිගත නොහැකි බවත් පෙ. 29, පෙ 30 නොසලකා හරින බවත්, එහෙත් පසු දාතම් කර තනතුරේ පිහිටුවීම මත සිදුවන වැටුප් වැඩිවීම් අනුව ETF, EPF සකස් කර එයට අහිමි වන පොලිය නිසි ලෙස ගණනය කර ගෙවීම් කරන්න. ඉල්ලුම්කරු කියා සිටින අර්ථ සාධක අරමුදලේ ණය ගැනීම් වැනි ප්‍රතිලාභ අහිමිවීම් සත්‍ය විය හැකි වුවත් එය උපකල්පන බැවින් ඒ සඳහා වන්දි ගෙවීමක් සාධාරණී කරණය කළ නොහැක.

මෙම සිද්ධියේ දී අධ්‍යක්ෂක මණ්ඩලය දෙවන විනය පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කළ අවස්ථාවේ විනය පරීක්ෂණය නිලධාරි (නීතිඥයෙකු) දෙන ලද උපදෙස් අධ්‍යනය නොකර ක්‍රියා කිරීම නිසා ඉල්ලුම්කරුට මෙන්ම ආයතනයට ද විශාල පාඩුවක් අලාභයක් වන අතර ආයතනයේ කීර්ති නාමයට ද අහිත කර වේ. දේශපාලන කෝණයකින් හෝ පුද්ගලිකව පලිගැනීමේ චේතනාවකින් තොරව විධිමත් නිරීක්ෂණකින් යුතුව අදාළ විශේෂඥ උපදෙස් ගැන සභාපති ඇතුලු අධ්‍යක්ෂක මණ්ඩලය තීරණ ගනු ලැබුවේ නම් සිද්ධිය දුර දිග නොයාමට හා දෙපාර්ශ්වයටම ඇතිවන පාඩු සහ අලාභ මඟ හරවා ගැනීමට ඉඩ තිබුණි.

මෙම ඉහත නිර්දේශයන් 2024.09.12 වන දින වන විට ගනු ලැබූ පසු හිඟ වැටුප් සැකසීම හා දීමනා ලබාදීම පිළිබඳව A/86/2019 හා 2024.10.28 දින නිකුත් කළ ලිපිය අනුව විමසීම් කල විට එයට පිළිතුරු ලෙස සාමාන්‍යාධිකාරියේ (ජාතික නිවාස සංවර්ධන අධිකාරි) අංක 3/2/3/3/1/429/ ii වෙලුම යටතේ එවා ඇති පිළිතුරු ලිපිය මගින් H.M.1.1 වැටුප් කාණ්ඩය පිහිටුව හොත් අදාළ වැටුප් සංශෝධන සහිතව හිඟ වැටුප රුපියල් 4,193,508.09 වන බව දන්වා ඇත. 2025.01.16 දින නැවත මෙම නඩුව පිළිබඳව දෙපාර්ශවයම ගෙන්වා කරන ලද සාකච්ඡාවේදී 2024.12.10 දිනැති සාමාන්‍යාධිකාරිවරයා සකසා එවා ඇති හිඟ වැටුප, තනතුර, උසස් වීම සඳහා ඉල්ලුම්කරුගේ නීතිඥවරයා එකඟ වන ලදී. ඉහත සඳහන් වූ සාක්ෂි සටහන් ලකුණු කළ ලේඛන දෙපාර්ශ්වය සමග කරන ලද සාකච්ඡා හා එකඟතා අනුව H.M.1.1 සහකාර සාමාන්‍යාධිකාරි නිලයේ තබා එයට අදාළ වැටුප් කාණ්ඩයේ 2018.03.18 පිහිටුවන ලෙසත් ඉහත සඳහන් රුපියල් 4,193,508 ක (හතලිස් එක් ලක්ෂ අනූ තුන් දහස් පන්සිය අට) මුදල මෙම නියෝගය ගැසට් නිවේදනයේ පළවී සති දෙකක් තුළ ඉල්ලුම්කරුට ලබාදී දැනට ආයතනයේ සේවය කරන බැවින් ගෙවන ලද බව දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කරන ලෙස (ලියාපදිංචි තැපැලෙන් ) නියෝග කරමි.

මෙම තීරණය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

**නීතිඥ ආර්.එස්. ආරියප්පෙරුම,**
බේරුම්කරු.

2025 ජූලි මස 16 වැනි දින.

EOG 08-0286

මගේ අංකය: IR/COM/01/2017/26.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.07.04 දිනැති හා අංක 2078/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.06.25 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හඳපාන්ගොඩ, බටුගම්පල, ජන උදාන ගම්මානය, අංක 65 හි පිහිටි එස්. මධුරවීරන් මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, ලංකා බැංකු මාවත, අංක 01 හි පිහිටි ප්‍රධාන කාර්යාලය, ලංකා බැංකුව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A40/2018 හා 2025.07.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.එම්.ඩී.එන්.කේ.වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අගෝස්තු මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව**

එස්. මධුරවීරන් මයා,
අංක 65,
ජන උදාන ගම්මානය,
බටුගම්පොල,
හඳපාන්ගොඩ.

නඩු අංකය : A/40/2018.
IR/COM/01/2017/26.

සහ

ලංකා බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 01, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියේ ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා හට පවරා ඇත.

එකී යොමු කිරීම අනුව පාර්ශ්වකරුවන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී ඇත්තේ

“1981.08.27 දින සිට ලංකා බැංකුවේ සේවය කරන ලද එස්. මධුරවීරන් මහතා ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගෙන ඇත්තේ 2001.10.03 වැනි දින වන අතර නිසි වයස සම්පූර්ණ වීම මත 2004.12.04 දින විශ්‍රාම ගන්වනු ලැබීමෙන් නියමිත ස්ථිර සේවා කාලය සම්පූර්ණ නොකිරීම යන හේතුව මත විශ්‍රාම වැටුප් හිමිකම අහිමි කිරීම යුක්ති සහගතද යන්න හා යුක්ති සහගත නොවේ නම් ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ. ”

දෙපාර්ශ්වය විසින් අදාළ විස්තර ප්‍රකාශ ගොනු කළ පසු 2018.10.12 දින වන දින නඩුව කැඳවූ අවස්ථාවේ දී ඉල්ලුම්කරු වෙනුවෙන් සී.ජේ. රංජිත් මහතා පෙනී සිට ඇත. වගඋත්තරකාර ලංකා බැංකුව වෙනුවෙන් නීතිඥ අනුෂා චන්ද්‍රසේකර මහත්මිය විධායක නිලධාරි එල්.එච්.සී.පී. ශාමන්ත මහතා සහ සහකාර කළමනාකරු එස්.ඒ. විනෝද් මහතා පැමිණ සිටිය දී වගඋත්තරකාර ලංකා බැංකුවේ මෙම නඩුවට පෙනී සිටින ජ්‍යෙෂ්ඨ නීතිඥ මහත්මිය පැමිණ නොසිටින බැවින් දිනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ " මේ නඩුව පිළිබඳව සමථයක් තිබේ නම් දෙපාර්ශ්වය විසින් අධිකරණයෙන් පිටත දී සලකා බලා බේරුම්කරු අධිකරණයට පැමිණෙන ලෙස දන්වන ලදී. ඒ අනුව 2018.11.30 දින ඉල්ලුම්කරු වෙනුවෙන් නීතිඥ බුද්ධික ද සිල්වා මහතා ද වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් නීතිඥ යශෝරාවී බක්මීවැව මහත්මිය සමග ආයතනයේ නීතිඥ අනුෂා චන්ද්‍රසේකර, දයා නන්දනී පීරිස් මහත්මිය සමග මානව සම්පත් විධායක නිලධාරි එල්.එච්.සී.බී. ශාමන්ත මහතා පැමිණ සිටිය දී දෙපාර්ශ්වයේ අදහස් විමසා නැවත වරක් සමථයක් කිරීමට හැකියාවක් ඇත්නම් සලකා බැලීම සඳහා ඉල්ලුම්කාර පාර්ශ්වයට සමථ යෝජනා භාර දෙන ලෙස වගඋත්තරකාර පාර්ශ්වයට දන්වන ලදී. ඒ සඳහා 2018.12.18 වැනි දින කැඳවන ලදී.

2018.12.18 දින නඩුව කැඳ වූ විට වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ යශෝරාවී බක්මීවැව මහත්මිය සමග ආයතනයේ නීතිඥවරු සහ මානව සම්පත් අංශයේ නිලධාරින් නියෝජනය කර සිටිය දී කියා සිටියේ " මෙම නඩුවේ සමථ යෝජනා ඉදිරිපත් කරන ලද්දේ 2018.12.17 (පෙර දින ) පස්වරුවේ බැවින් මානව සම්පත් (HRPE) ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කිරීමට කාලය නොමැති බැවින් ඉදිරි ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කර වගඋත්තරකාර ආයතනයේ තීරණය දැනුම් දීමට දින අයැද සිටි අතර ලංකා බැංකු සේවක සංගමය ඒ සඳහා විරෝධතාවයක් නොමැති බව දන්වා සිටින ලදී.

2019.01.29 දින නඩුව කැඳවූ අවස්ථාවේ වගඋත්තරකාර පාර්ශ්වය කියා සිටියේ 2018.12.14 දින ඉදිරිපත් කළ සමථ යෝජනාව සලකා බලන ලද බවත් එයට එකඟ විය නොහැකි බවත් මානුෂික හේතුන් මත දීමනාවක් ලෙස රුපියල් ලක්ෂ පහක මුදලක් දිය හැකි බවත් එය 2019.02.25 දින දිය හැකි බවත් ය. ලංකා බැංකු සේවක සංගමය නියෝජනය කළ නියෝජිත මහතා කියා සිටියේ ලක්ෂ අසූවකට ආසන්න මුදලක් ඉල්ලුම්කරු ඉල්ලා ඇති බැවින් සාධාරණ ක්‍රමවේදයක් අනුගමනය කර ලක්ෂ 10 ක මුදලක් ලබා දෙන ලෙස ප්‍රතියෝජනාවක් කරන ලදී. මධුරවිරන් මහතා කියා සිටියේ බැංකු සේවක සංගමය සමග මෙම නඩුවට ඉදිරියට ගෙන යාමට (නියෝජනය) සූදානම් නැති බවයි. එයට විරෝධතාවයක් නොමැති බවත් නඩු කටයුත්තෙන් බැංකු සේවක සංගමය ඉවත් වෙන බවත් කියා සිටින ලදී.

නැවත 2019.02.25 දින නඩුව කැඳවූ අවස්ථාවේ ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජනයක් නොමැති වූ අතර දෙවන පාර්ශ්වයේ ඉල්ලීම වූයේ 2018.09.13 දින ඉදිරිපත් කළ දෙවන ප්‍රකාශයේ විරෝධතා සඳහා ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට දිනයක් ලබා දෙන ලෙසයි. 2019.05.13 දින නැවත නඩුව කැඳවූ අවස්ථාවේ දී ඉල්ලුම්කරු වෙනුවෙන් අනුෂා චන්ද්‍රසේකරන් මහත්මිය පෙනී සිටින ලදී. නැවත 2019.05.30 දින කැඳවූ අවස්ථාවේ සමථයක් නොමැති බැවින් විභාගයට නියම කරන ලෙස ඉල්ලුම්කාර පාර්ශ්වය කියා සිටින ලදී. මේ අවස්ථාවේ දෙවන පාර්ශ්වය 2019.05.30 දින දරන නියෝගයට එරෙහිව අභියාචනයක් කිරීමට පියවර ගෙන ඇති බැවින් දීර්ඝ දිනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙම නඩුවේ ඉල්ලුම්කරුට මෙම නඩුවේ පසුබිම අනුව සමථයකට එකඟවන ලෙස දැනුවත් කලත් සමථයකට එකඟ නොවන බැවින් වගඋත්තරකාර පාර්ශ්වයේ ක්‍රියාමාර්ගයට අවහිර නොකරන බවත් දෙන ලද දිනය අතරතුර සමථයකට එළඹෙන්නේ නම් නඩුව අවසන් කළ හැකි බවත් ඉල්ලුම්කරුගේ නීතිඥතුමියට දන්වා සිටින ලදී.

අභියාචනයක් ඇති බැවින් අභියාචන තීන්දුව ලැබෙන තෙක් මෙම නඩුව විමසීමට හෝ අවසන් තිරණයක් දීමට නොහැකි බැවින් දිගින් දිගටම දින දීමට සිදු විය. අභියාචනාධිකරණය විසින් ඉදිරිපත් වී ඇති ලේඛන සලකා බලා නව තිරණය දන්වන ලෙස නියෝග කර ඇති බැවින් ඒ අනුව අදාළ ලේඛන අනුව තිරණයක් ලබා දෙන්නෙමි.

1994 මැයි දින ජනාධිපතිතුමා කරන ලද ප්‍රකාශයකට අනුව රාජ්‍ය පරිපාලන ඇමතිතුමාගේ 1994 ජූලි මස 04 දින සහ ආසන්න දින වල රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛන මත 16/94, 16/94(i) සහ 16/94(ii) චක්‍රලේඛන අනුව ඉල්ලුම්කරුට ඇති අධ්‍යාපන සුදුසුකම වන පස්වැන්න සමත් වීම ප්‍රමාණවත් නැත. ලංකා බැංකුවේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවකයෙකු සඳහා අදාළ තනතුරට අනුව සුදුසුකම් තිබිය යුතු ය. කම්කරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් නොසලකා මධුරවිරන් මහතාගේ දිගු කාලින සේවාව සලකා 2001.10.03 වැනි දින ස්ථිර සේවයට පත් කළ අතර විශ්‍රාම ගැන්වීමේ වයස අනුව 2024.12.04 විශ්‍රාම ගන්වනු ලැබ ඇත. විශ්‍රාම වැටුප් හිමිවීමට අවශ්‍ය සේවා කාලය 2004.12.04 දිනට සම්පූර්ණ නොවන නිසා විශ්‍රාම වැටුපට හිමිකම් අහිමි කිරීම සිදුව ඇත.

කාර්මික ආරාවුලක් පළමුව සමථයකට පත් කළ යුතුව ඇති බැවින් හා දෙවන පාර්ශ්වය විසින් 2019.01.29 වැනි දින කරන ලද ප්‍රකාශය වූ " මෙම නඩුව මානුෂික හේතු මත සලකා බලා සානුකම්පිත දීමනාවක් ලෙස රුපියල් ලක්ෂ 05 ක් (500,000.00) මුදලක් ගෙවා සම්පූර්ණ හා අවසන් සමථයකට එකඟ බව " සැළකර සිටීම මත ඉල්ලුම්කරුට නෛතික තත්ත්වය අනුව කටයුතු කළහොත් ඇති වන තත්ත්වය පහදා දී (2019.07.08 දින දෙවන පිටුවේ සටහන්) සමථයක් කිරීමට දිගින් දිගට උත්සාහ කරන ලදී.

කෙසේ වෙතත් 2009.02.06 වැනි දින ලංකා බැංකුව විසින් මදුරවීරන් මහතා 1990.11.20 දින සිට ස්ථිර සේවකයෙකු ලෙස මානුෂික හේතූන් මත සලකන බවටත් 1990.11.20 සිට 2001.10.02 දක්වා සහ 2004.12.04 විශ්‍රාම ගන්වන දින දක්වා ගෙවීම් කරන බව දන්වා ඇත. " ඉල්ලුම්කරුගේ " U ලේඛනය " නමුත් 2009.02.06 දිනැති එකී ලිපිය 2009.08.20 දින ඒකපාර්ශ්විකව වහාම ක්‍රියාත්මක වන පරිදි ආපසු ගන්නා බව දැන්වීමෙන් එකී කාලය තුළ ඉල්ලුම්කරුට නීත්‍යානුකූල අපේක්ෂාවක් ඇති කර ඇත. ඉල්ලුම්කරුගේ "U - 1" ලේඛනය

කෙසේ වෙතත් අභියාචනාධිකරණය දී ඇති නියෝගය පරිදි සාක්ෂි නොවිමසා දැනට ඉදිරිපත්ව ඇති ලේඛන අනුව මධුරවීරන් මහතාට ස්ථිර සේවා කාලයක් නොමැතිව විශ්‍රාම ගැන්වීම මත විශ්‍රාම වැටුපකට හිමිකම් අහිමි කිරීම යුක්ති සහගත යැයි තීරණය කලත් ඔහු වෙත ඇති කර ඇති නීත්‍යානුකූල අපේක්ෂාව උල්ලංඝනය වී ඇති බව පෙනේ. ඒ අනුව ඔහුට සාධාරණ හා යුක්ති සහගත යැයි දන්වන ලද මුදල වන රුපියල් පන් ලක්ෂය (500,000.00) මෙම ප්‍රදානය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුලත දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන මෙන් නියම කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සදහන් කරමි.

**ආර්.එස්. ආරියප්පෙරුම,**
බේරුම්කරු.

2025 ජූලි මස 18 වැනි දින.

E0G 08-0287

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.